
# හාෆ් ශීට් ගොඩ(ගේ)

## පමා නොවී එමි අකුරට

ගල්ලැල්ලේ සහ ගල්කූරේ සිට ඇක්සයිස් පොත සහ පැන්සලට උසස් වීමද, එමෙන්ම පැන්සලේ සිට පෑනට උසස් වීම ද අපේ පාසල් ජීවිතයේ සුවිශේෂී වැදගත්කමකින් යුතු වූ සන්ධිස්ථාන ලෙස සැලකිය හැක. අද ඕස්ට්‍රේලියාවේ පවා, අපේ දරුවන්ට තුන්වන ශ්‍රේණිය අවසානයේ දී පමණ ලැබෙන "පෑන් ලැයිසොම" මනා චිත්ත ප්‍රීතියක් ඇති කරවන්නකි. එම ප්‍රීතිය, ටික දිනකට පසු, තමන් පෑනෙන් ලියන දේ ඉස්සර පැන්සලෙන් ලියන කාලයේ දී මෙන් වැරදුනු විට රබර් කෑල්ලෙන් මකා නිවැරදි කළ නොහැකි බව අවබෝධ කරගන්නා තෙක් ම පවතී.

රජයේ කාර්යාල වල වැඩකරන සමහරුන් ගේ දරුවනට නම් හාෆ් ශීට් වලින් ස්වයංපෝෂිත වීමට බොහෝ ඉඩකඩ තිබේ. මට නම් තිබුණු එකම විසඳුම, ඊට පෙර ඇක්සයිස් පොත් ගත්තා සේම, පොත් කඩයකට ගොස් අවශ්‍ය පරිදි හාෆ් ශීට් මිලට ගැනීමයි. මෙහිදී එක් අතුරු කතාවක් කියනවා නම්, මේ කාලයෙන් වසර දෙලහකට පසු මා ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාලයක සේවය කරන කාලයේ දිනක් ගම්පහ පොත් සාප්පුවකින් මා හාෆ් ශීට් මිටියක් මිලට ගන්නවා දුටු එම අවස්ථාවේ එහි සිටි එම විශ්ව විද්‍යාලයේම සේවය කරන අයෙකු දැඩි ලෙස විමතියට පත්වී, "හාෆ් ශීට් කඩෙන් ගන්නවා ද?" යි විමසීය.




උසස් පෙල හදරන සමයේ ද අපේ ජීවිත වල නැවතත් මේ ආකාරයේ වෙනස් වීමක් සිදු විය. එය නම්, මොනිටර් ඇක්සයිස් පොත් වල පාසල් සටහන් ලිවීමේ සිට ඒ සඳහා හාෆ් ශීට් භාවිතය දක්වා වූ උසස් වීමයි. මේ සඳහා කිසිවෙකුගෙන් ලැයිසොං ගැනීමක් අවශ්‍ය නොවූ බව ද කිව මනාය. එය අප ම අපට ම දුන් උසස් වීමකි.

දහයේ පන්තියේ ඉගෙන ගනිමින් මොනිටර් පොත් වල ලියූ කාලයේ සිටම මම හාෆ් ශීට් වලට සංක්‍රමණය වීම ගැන සිහින දුටුවෙමි. ඒ දින එනතුරු ඇඟිලි ගැන්නෙමි. ඒ අන් හැම සංක්‍රමණයකින්ම මෙන් මෙයින් ද සිදුවෙන වාසි සලකා ය.

ඇක්සියස් පොත් භාවිත කරන විට එක් දිනක් හෝ පාසල් ඒම මග හැරුණොත් ඒ අතපසු වූ සටහන් ලිවීම සඳහා අවශ්‍ය ඉඩ ඇස්තමේන්තු කර, එපමණක් හිස්ව තබා නැවත ලිවීම කළ යුතු වේ. හාෆ් ශීට් වල ලිවීමේ දී මෙවැනි ඉඩ තැබීමේ ප්‍රශ්ණයක් නැත. අළුත් දිනක අළුත් කොලයකින් පටන් ගත හැක. ඒ සමගම බරැති මොනිටර් පොත් කිහිපයක් වෙනුවට එදිනෙද රැගෙන යා යුත්තේ සැහැල්ලු හාෆ් ශීට් කිහිපයක් පමණි. පෙර දී මෙන් නොව ණයට ගැනීමද, ණය දීම ද පහසුවෙන් කළ හැකි විය. මේ සියල්ලටත් වඩා, විශ්ව විද්‍යාල ශිෂ්‍යයෝ සටහන් ලියන්නේ හාෆ් ශීට් වල බව අප දැන සිටි නිසා, විශ්ව විද්‍යාල ප්‍රවේශයේ සිටි අප ද එලෙසම කිරීමේ යම් කිසි උජාරුවක් ද තිබුණි. එයට අමතරව මේ හාෆ් ශීට් වල ලියන සටහන් තබා ගත යුත්තේ ෆයිල් කවර වල නිසා, එවැනි ෆයිල් කවර පාවිච්චියටත්, ඒවා රැගෙන ඔබ මොබ යෑමටත් අපට අවස්ථාව ලැබුණි.

අප දන්නා පරිදි නිෂ්පාදනය කෙරෙන ස්ථානයේ දීම හාෆ් ශීට් 500 බැගින් බන්ඩලවලට ඇහිරේ. පොත් කඩ වලට ඒවා එන්නේ එවැනි බන්ඩල කිහිපයක් ම ඇහුරූ පෙට්ටි වශයෙනි. එසේ වූවද, අද මට නිරවුල්ව වටහා ගත නොහැකි කරුණක් නිසා මම පාසල් සමයේ කිසි දිනක දී හාෆ් ශීට් 500 ක් අඩංගු බන්ඩලයක් එකවර මිලදී ගන්නට නොසිතීමි. ඒ වෙනුවට සෑමදම මා මිල දී ගත්තේ හාෆ් ශීට් 100 ක් පමණි. ඒ කොලවල ලියා අවසාන වූ පසු තවත් 100 ක් මිලදී ගත්තෙමි. මෙය අනිවාර්යයෙන්ම වියදම් වැඩි ක්‍රමයක් විය. හාෆ් ශීට් 100 ක් විකිණීම සඳහා ඒවා එකින් එක ගනං කිරීමට ද සිදුවෙන නිසා වැඩි මිලක් ගෙවන්නට වීම පුදුමයක් ද නොවේ.

ඒ තර්ක කෙසේ වූවද, ආනන්දයේ උසස් පෙල ඉගෙනුම ලැබූ මට හාෆ් ශීට් මිළට ගැනීම සඳහා තිබූ ආසන්නම ස්ථානය වූයේ ගොඩගේ පොත් කඩයයි.

එදා හැත්තෑවේ දශකයේ අග දී මරදන බොරුල්ල පාර සහ ආනන්ද මාවත මංසන්ධියේ පිහිටා තිබුණේ අද දක්නට ලැබෙන දෙමහලින් යුතු සුවිසල් ගොඩගේ පොත් මැදුර නොව, මගේ මතකයේ හැටියට, කුඩා පොත් කඩයකි. එහි ඉදිරිපස ම ප්‍රදර්ශක අල්මාරි යනාදිය තිබුනු අතර, අයිතිකරු (පසුව මා දැනගත් පරිදි සිරිසුමන) ගොඩගේ එයින් පිටුපස නිරතුරු වාඩි වී සිටියේය. වර්ණවත් කපු ගවුමෙන් සැරසුණු යුවතියක් හෝ දෙදෙනක් ද වෙළඳ කටයුතු සඳහා සහයට එහි සිටියහ. මම කඩයට ගොඩ වී හාෆ් ශීට් 100 ක් ඉල්ලමි. තරුණියක් බන්ඩලයකින් කොල ගෙන ගනං කරයි. අදාල මුදල ගොඩගේ ට ගෙවා කොල මිටිය ෆයිල් කවරයේ ද ගන්නා මම නික්ම යමි.



දිනක් පාසලට ගොස් හාෆ් ශීට් මිටිය දෙවරක්ම ගනං කර බැලූ මට පෙනී ගියේ, එහි ඇත්තේ කොල 98 ක් පමණක් බවයි. මගේ මතකයේ හැටියට, මෙය එකල ශත දහයක (?) පමණ පාඩුවකි. මම ඉවසා සිටියෙමි. අද පවා බැංකුවෙන් සල්ලි කොල මිටියක් හෝ කඩයකින් ඉතුරු සල්ලි හෝ ලැබුණු විට එය එතනම ගනන් කර නිවැරදි දැයි බැලිය යුතු වේ. නමුත්, හාෆ් ශීට් මිළට ගෙන එසේ කිරිම ප්‍රායෝගික නොවේ. වරද මගේ ය. මම පාඩුව දරා ඉවසා සිටියෙමි.

මසක් පමණ ගතවී, එදා ගත් හාෆ් ශීට් මිටියේ අවසාන කොළ කිහිපයට ලඟා වූ කල, මම යලිත් ගොඩගේ පොත් කඩේ ට ගියෙමි. එහි සිටි යුවතිය සුපුරුදු පරිදි මා වෙනුවෙන් හාෆ් ශීට් 100 මිටිය ගනං කරද්දී "ගිය මාසේ ගත්තු ගොඩේ තිබුනේ කොල 98 යි" යැයි මම නිකමට මෙන් ඇයට පැවසුවෙමි. ඒ වදන් ඇසී මා දෙස එක් වරක් බැලූ කැෂියර් පුටුවේ වාඩිවී සිටි සිරිසුමන ගොඩගේ, වෙළඳ සේවිකාව අමතා "කොල දෙකක් වැඩිපුර දෙන්න" යැයි නියම කළේ ය.

එදා මා ගොඩගේ පොත් හලෙන් නික්ම ගියේ සිත පිරී ගිය සතුටකින් බව අමුතුවෙන් කිව යුතු නැත. ඒ කොල දෙකේ පාඩුව පිරිමැසී ගිය නිසා ඇතිවූ සතුටක් පමණක් නොවේ. දහසය වසරක් වයසැති පාසල් සිසුවෙකු වූ මගේ වචනයක් අන් අයෙක් එක හෙලා පිළිගත් හෙයින් හටගත් චිත්තප්‍රමෝදය ශත දහයට වඩා සිය ගුණයක් වටනේ විය.

එදට පසුව මගේ වචනයක් එලෙසම වෙනත් කෙනෙක් නිසැකවම පිළිගන්නා අවස්ථාවක් යලි උදා වූයේ පුරා වසර දසයකට පසු ඕස්ට්‍රේලියාවේ දී ය. එහෙත් ඒ තත්වයද දැන් දැන් වෙනස් වෙමින් පවතින බව පෙනේ. ඒ පුද්ගලයෙක් වශයෙන් මා කෙරෙහි අනුන්ගේ ඇති වී ඇති අවිශ්වාසයක් නිසා නොව, පොදුවේ සමාජයක් වශයෙන් අද අප අන් අයව විශ්වාස කරන්නට දක්වන මැලිකමය.

කෙසේ වෙතත් අද මා මිලට ගන්නේ හාෆ් ශීට් බන්ඩල පිටිනි. ඒ ද, අර ලංකාවේ තිබූ අව පැහැති බාල තත්වයේ කඩදාසි නොව ඉස්තරම් ප්‍රමිතියේ කිරි සුදු පැහැති ෆොටෝ කොපි කොල ය.

රසික සූරියආරච්චි

[rasika.suriyaarachchi@gmail.com]

